සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

7 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

කාලය පැය 01 යි විනාඩි 30 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **ප්‍රශ්න අංක 01 - 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ස්වරයට ඉහළින් තිතක් සළකුණු කරනුයේ,
(1) මන්ද්‍ර ස්වර වලය (2) උච්ච ස්වර වලය (3) මධ්‍ය ස්වර වලය (4) ශුද්ධ ස්වර වලය

02 සප්තකයේ ඇති අචල ස්වර සංඛ්‍යාව,
(1) 05 කි. (2) 03 කි. (3) 02 කි. (4) 06 කි.

03 ලඝු අකුරු යනු,
(1) දිගු අකුරුය. (2) නොඇදෙන කෙටි අකුරුය.
(3) හල් අකුරුය. (4) බැඳි අකුරුය.

04 චල ස්වර ප්‍රභේද වන්නේ,
(1) කෝමල හා තීව්‍ර ලෙසය. (2) වාදී හා සංවාදී ලෙසය.
(3) කෝමල හා ශුද්ධ ලෙසය. (4) තීව්‍ර හා උච්ච ලෙසය.

05 ස, සරිස, සරිගරිස, .............. මෙම ස්වර රටාවේ මීළඟට යෙදෙන ස්වර පියවර වන්නේ,
(1) සරිසරිගරිස (2) සරිගමගරිස (3) සරිසගරිස (4) සරිගමපමගරිස

06 ස්වර ස්ථාපන ගී ගැයීම තුළින්,
(1) ස්වර ඥාණය වැඩිවේ. (2) තාල ඥාණය වැඩිවේ.
(3) රාග ඥාණය වැඩිවේ. (4) සංගී ඥාණය වැඩිවේ.

07 ''සවන පිනන ගීත මිහිර......'' මෙම ගීය ගැයෙන රිද්මය,
(1) මාත්‍රා 2 න් 2 ය. (2) මාත්‍රා 3 න් 3 ය. (3) මාත්‍රා 4 න් 4 ය. (4) මාත්‍රා 2 න් 4 ය.

08 තාල තැබීම සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ සහිත පිළිතුර තෝරන්න.
(1) තබ්ලාව, වයලීනය, ගිටාරය (2) බෙරය, බටනලාව, සිතාරය
(3) තබ්ලාව, බෙරය, තාලම්පොට (4) සර්පිනාව, තබ්ලාව, බෙරය

09 1'2 / 1'2 / 1'2 / 1'2 මෙම තිත් රූපයට අදාල තිත නම් කරනු ලබන්නේ,
(1) මැදුම් තනි තිත ලෙස ය. (2) මහ තනි තිත ලෙස ය.
(3) සුළු තනි තිත ලෙස ය. (4) සුළු මහ දෙතිත ලෙස ය.

10 කෙළි ගීතයක් වන්නේ,
(1) දකුණ නැගෙනහිර (2) නිල් අහස් තලේ
(3) අහසට පිඹිනා (4) බැතිනා සිරිපා කරුණා කරනා

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා වරහන් තුල දී ඇති පිළිතුරු වලින් තෝරා හිස් තැනට සුදුසු වචනය ලියන්න.**

(තබ්ලාව / රාමායනය / ප්ලුත / මාත්‍රා 4 න් 4 / කෝමල)

11 හීන්, පාන්, වැන් ආදී වචන හිමි මාත්‍රා ................ මාත්‍රා නමින් හැඳින්වේ.

12 ''අඹ දඹ නාරං.......'' ගීතය ................ නූර්තියේ එන ගීතයකි.

13 ................ හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.

14 ස්වරයට යටින් තිරස් ඉරි කැබැල්ලක් ගසා ................ ස්වර නම් කරනු ලබයි.

15 ''දිය ගොඩ සැම තැන........'' ගීතය ගැයෙනුයේ මාත්‍රා ................ ය.

- **පහත සඳහන් වාක්‍යය නිවැරදි නම් (✓) ද, වැරදි නම් (×) ලකුණට ඉදිරියෙන් යොදන්න.**

16 ආදේශ සංගීත භාණ්ඩ තුළින් විවිධ නිර්මාණ කළ හැකි ය. ( )

17 ගුරු අකුරක වටිනාකම මාත්‍රා 04 කි. ( )

18 නරිබැනා නාට්‍යයේ දෙබස් රබන් පද ආශ්‍රිතව නිර්මාණය කොට ඇත. ( )

19 මුණි සිරි පාදේ....... මෙම ගීතය ස්වර ස්ථාපන ගීයකි. ( )

20 උපදේශනාත්මක ගී තුළින් යම් යම් අවවාද ලබා දේ. ( )

## 7 ශ්‍රේණිය පෙරදිග සංගීතය - II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01 (i) ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගී හතරක මුල් පද පේළිය බැගින් ලියා දක්වන්න. (ල.04)

(ii) ඉන් එක් ගීතයක් නිවැරදි ව ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල.06)

02 (i) තාලය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

(ii) මාත්‍රා 3 න් 3 ට තාල තැබෙන හින්දුස්ථානී තාල පදය කුමක් ද? (ල.02)

(iii) මාත්‍රා 2 න් 2 සහ 3 න් 3 තාල තැබෙන ගීත 06 ක් නම් කරන්න. (ල.03)

(iv) ත්‍රිවිධ ලය නම් කරන්න. (ල.03)

03 (i) සප්තකයේ ඇති සියලු ස්වර දී ඇති හිස්තැන් පුරවමින් පිළිවෙලින් ලියා දක්වන්න. (ල.05)

ස , - , - , - , - , - , ම' , - , - , - , - , -

(ii) ස්වර පුවරුවක් ඇඳ ශුද්ධ ස්වර 07 ලකුණු කරන්න. (ල.05)

04 (i) දේශාභිමානී ගීත 05 ක් නම් කරන්න. (ල.05)

(ii) ඔබ කැමති එක් දේශාභිමානී ගීතයක පද මාලාව ලියන්න. (ල.05)

05 (i) ඔබ උගත් කෙළි ගී වර්ග 04 ක් නම් කරන්න. (ල.04)

(ii) ඒ එක් එක් වර්ගය සඳහා ගී පාදය බැගින් ලියන්න. (ල.06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | 1 | 11 | ප්ලුත | 16 | ✓ |
| 02 | 3 | 07 | 2 | 12 | රාමායණය | 17 | ✗ |
| 03 | 2 | 08 | 3 | 13 | තබ්ලාව | 18 | ✓ |
| 04 | 1 | 09 | 3 | 14 | කෝමළ | 19 | ✓ |
| 05 | 2 | 10 | 3 | 15 | මාත්‍රා 4/4 | 20 | ✓ |

(1 x 20 = ල. 20)

## II කොටස

01 (i) එකට සතුට සාගරේ / බැතිනා සිරිපා / ඈත ඇදී යලි මැතට පාවේ / කඳු කඳු නැගෙනා / හොඳ දේ හිතමී / කඳු පෙළ අතරේ / ගී ගයන මේ කුරුළු යාලුවන් හා / මුණි සිරි පාදේ / ඈත ආකහේ / ඈත හිමේ ගිරි මුදුනේ...... (ල.04)

(ii) නිවැරදි ගීත ස්වර ප්‍රස්ථාරය ඇත්නම් (ල.06)

02 (i) තාල යනු සංගීතයේ දී කාලය මනිනු ලබන මිම්මයි. (ල.02)

(ii) දාදරා තාලය (ල.02)

(iii) එක් ගීතයකට ලකුණු ½ බැගින් (ල.03)

(iv) විලම්භ ලය, මධ්‍ය ලය, ද්‍රැත ලය (ල.03)

03 එක් ස්වරයකට එක් ලකුණ බැගින් (ල.10)

04 (i) එක් ගීතයකට එක් ලකුණ බැගින් (ල.05)

(ii) ගීතය ලියා ඇති පිළිවෙල අනුව ලකුණු ලබා දෙන්න. (ල.05)

05 (i) එක් වර්ගයකට එක් ලකුණ බැගින් (ල.04)

(ii) එක් එක් වර්ගයේ ගී පාදයන් සඳහා ලකුණු 1½ බැගින් (ල.06)